# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව
# ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
# අම්පාර.
# 2020.01.30

දිස්ත්‍රික්කය :- අම්පාර

01. පිළිගැනීමේ කථාව :-

2020 වර්ෂයේ පවත්වනු ලබන පළමු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම නව වසරට සුභාසිරි එක්කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා විසින් කමිටුවට සහභාගී වී සිටි අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිණී ශ්‍රියානි විජේවික්‍රම මැතිනිය , ගරු වනජීවී රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමන් දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිණී අනෝමා ගමගේ මැතිණිය, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසල් කාසිම් මැතිතුමන්, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ. කෝඩීස්වරන් මැතිතුමන්, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එච්.එම්.එම් හාරිස් මැතිතුමන් හා මැති ඇමතිතුමන්ලාගේ සම්බන්ධීකරණ නිලධාරීන්, මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවල නගරාධිපතිතුමන්ලා හා සභාපතිතුමන්ලාද, ප්‍රාදේශීය ලේකම්වරුන්ද, පළාත් සභාවේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින්ද දිස්ත්‍රික්කයේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින්ද, නියෝජ්‍ය පොලිස්පති තුමන්,යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, විශේෂ කාර්ය බලකාය නියෝජනය කරමින් පැමිණ සිටි ත්‍රිවිධ හමුදා නිලධාරීන්ද, සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්ද, මාධ්‍යවේදීන්ද ඇතුළුව සහභාගී වී සිටි සියළු දෙනා ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදි.

අනතුරුව දිසාපතිතුමන් විසින් කාලීනව වැදගත් වන විශේෂ කරුණු පිළිබඳව දැනුවත් කරමින් සභාවේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට සභාපතිතුමියට අවස්ථාව ලබා දෙන ලදී.

02. සභාපතිතුමියගේ කථාව.

2.1 <u>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි ගරු පාර්ලිමේන්තුමන්ත්‍රිණී ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය</u>

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු වනජීවී රාජ්‍ය අමාත්‍ය විමලවීර මැතිතුමන් ඇතුළු සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතන වල නගරාධිපතිතුමන්ලා හා සභාපති තුමන්ලා හා දිසාපතිතුමන් ඇතුළු සියළුම රජයේ නිළධාරීන්, එතුමිය විසින්ද පිළිගන්නා ලදි.

අනතුරු, පසුගිය සභාවාරයේ ගැටළු කෙටුම්පත් කර එම ගැටළුවලට කඩිනමින් විසඳුම් ලබා දීමට අදාළ දෙපාර්තමේන්තු කටයුතු කළ යුතු බවත්, ඉදිරි ගැටළු සඳහාද ඔවුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බවත් සභාපති තුමිය විසින් සභාවට දන්වා සිටින ලදි.

03. ලොව පුරා උද්ගත වී **"කොරෝනා වෛරසය"** පිළිබඳව ගරු සභාපති තුමිය ඉදිරිපත් කළ කරුණට අදාළව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පෙන්වා දෙන ලද්දේ කොරෝනා වෛරසය ලංකාවට ඍජු බලපෑමක් ඇති කරන බවට සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් දැනුවත් කිරීමක් සිදු කර නොමැති බවයි. එසේම, දැනට එක් රෝගියෙක් පමණක් වාර්තා වී ඇති අතර අදාළ රෝහල් වෙත යොමු කරමින් එම වෛරසය ආසාදිත යැයි සැක කරන සියළුම දෙනා නිරන්තර පරීක්ෂාවට ලක් කරන බවද ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යෂක විසින් වැඩිදුරටත් සභාව දැනුවත් කරන ලදි. මේ පිළිබඳ අනවශ්‍ය බියක් ඇති කර නොගත යුතු බවත් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බවත් දන්වා සිටින ලදි.

අම්පාර දිස්ත්‍රික්කය පුරා ප්‍රබලව පැතිර යන ඩෙංගු උණ රෝගය පිළබඳව මෙ අවස්ථාවේ දී අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදි. ඒ අනුව, අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශය තුල පමණක් මේ වන විට ඩෙංගු උණ රෝගීන් 152 ක් වාර්තා වී ඇති බව පෙන්වා දුන් අතර දිස්ත්‍රික්කය තුල අඩු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වුවත් අවධානම් තත්ත්වය ආරක්ෂා කර ගැනීමට සියළුම දෙනා කටයුතු කළ යුතු බවත් පෙන්වා දෙන ලදි. මේ සඳහා සියළුම ආයතන ප්‍රධානීන්ගෙන් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් සෞඛ්‍ය අංශයේ නිලධාරී කැඳවා තම ආයතන පරිශ්‍රයන් පරීක්ෂාවට ලක් කර ගන්නා ලෙස ඉල්ලීමක් ද කරන ලදි.

අනතුරුව එළඹියේ පසුගිය සභා වාරයේ වාර්තාව සභා සම්මත කිරීමේ අවස්ථාවයි. එහි දී සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමන් විසින් පසුගිය සභාවාරයේ තමන් විසින් වෙනත් යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන ලද කරංගාව කුඹුරු වගා කිරීමේ ගැටළුව හා අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තුමන් විසින් අඩ්ඩාලච්චේන පාලම් 05 ක් පිළිබඳව තමන් ඉදිරිපත් යෝජනාවද ඇතුළත්ව නොමැති බව ද පෙන්වා දෙන ලදි. අඩ්ඩාලච්චේන යෝජනාව මෙම සභා වාරයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති බැවින් සම්මන්තුර ගරු සභාපතිතුමාගේ යෝජනාව නැවත වාර්තාවට එක් කර සංශෝධනය කිරීමට උපදෙස් ලබා දුන් අතර සංශෝධනයන්ට යටත් ව පසුගිය වාර්තාව සභා සම්මත විය.

05. 2019.12.10 වන දින පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගත් තීරණ පිළිබඳ සාකච්ඡා කිරීම

| # | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විෂය | වගකීම් දරණ නිලධාරින්/ ආයතනය |
|---|---|---|---|
| 1 | | i. පානම මීයන්ගොඩ යාය වී වගා කිරීම සඳහා අවසර ලබා දීම. (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>ස්ථානීය පරීක්ෂාව සඳහා ඉදිරි සති දෙක තුළ දිනයක් ලබා දෙන බව ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදි. | ප්‍රදේශීය ලේකම්, ලාහුගල/සහකාර අධ්‍යක්ෂ, වනජීවි දෙපාර්තමේන්තුව, අම්පාර / දිසාවන නිලධාරි, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව, අම්පාර |
| 2. | ලාහුගල | ii. පානම රාගම්වෙල පීනට්ෆාම් ඉඩම් නිරවුල් කර පදිංචියට හා වගා කිරීමට බෙදා දීම. (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>නඩුවක් පවතින ගැටළුවක් හේතුවෙන්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් නඩුවේ ස්වාභාවය පිළිබඳව විමසා වාර්තාවක් සති දෙකක් තුළ ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට හා ලාහුගල ප්‍රාදේශීය ලේකම්ට දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, අම්පාර / ප්‍රාදේශීය ලේකම් - ලාහුගල |
| 3 | | iii. පානම ශාස්ත්‍රවෙල කච්චි කර ඇති ඉඩම් නිරවුල් කර දීම. (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>කඩිනමින් විසඳුමක් ලබා දීමට කටයුතු කරන ලෙස ලාහුගල ප්‍රාදේශීය ලේකම් ට දැනුම් දෙන ලදි. ඉඩම හිමියන් ගේ නාමලේඛනයක් සහිතව වාර්තාවක් සති දෙකක් තුළ ඉදිරිපත් කරන ලෙස දැන්විය. | ප්‍රාදේශීය ලේකම්, ලාහුගල/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, අම්පාර |
| 4 | | iv. පානම මහයාය අලි වැට සංශෝධනය කිරීම. (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>අලිවැට ගොවිතැන් කරන කොටසෙන් ඉවත් කර ඉදිකිරීමට වන ජීවී අධ්‍යක්ෂ එකඟ විය. | සහකාර අධ්‍යක්ෂ, වනජීවි දෙපාර්තමේන්තුව, අම්පාර |
| 5 | | v. නීලගිරි මාර්ගයේ හැඩඔය පාලම ප්‍රතිසංස්කරණය කිරීම. (ප්‍රාදේශීය ලේකම්, ලාහුගල)<br>මුදල් ප්‍රතිපාදන සලසා ගැනීමට පියවර ගන්නා මෙන් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදි. | විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, අම්පාර |
| 6 | | vi. ගංවතුර වළක්වා ගැනීම සඳහා සැලැස්ම සකස් කිරීම (ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ආචාර්ය එස්.එම්.එම්. ඉස්මයිල් මැතිතුමා)<br>සංශෝධන සහිතව අනුමත කරන ලද අතර අදාල නව සැලැස්ම කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමා විසින් දන්වා සිටින ලදි. | සහකාර අධ්‍යක්ෂ, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, අම්පාර. |
| | | i. ගංවතුරින් හානි වූ ප්‍රධාන බෝග වගාවන් පිළිබඳ තොරතුරු | |

| | | | |
|---|---|---|---|
| 7 | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ඉදිරිපත් කිරීම (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුල්ල දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>වන්දි ලබා දීමෙ දී කලින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගයන් නිසිපරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වන්දි මුදල් නොලැබී යන බව මෙහිදී තහවුරු විය. ඒ අනුව, නිශ්චිත කන්න රැස්වීම්වලින් එහාට ගිය ක්‍රමවේදයක් කමිටුවක් මගින් තීරණය කර සති දෙකක් ඇතුළත සියළුම දෙනාටම වන්දි ලබා දීමෙ වැඩපිළිවෙලක් සකස් කරන මෙන් දැන්විය.එසේම, විශේෂ කමිටුවක් පත් සාධාරණ දින වකවානුවක් පිළිබඳ තීරණයක් ගැනීමට එකඟතාවය පළ විය. ගොවීන් දැනුවත් කිරීමට ආයතන මට්ටමින් කටයුතු කළ යුතු බවද මෙහිදී අවධාරණය විය. | සහකාර කොමසාරිස්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව/ සහකාර අධ්‍යක්ෂ, කෘෂිරක්ෂණ මණ්ඩලය. |
| 8 | උහන | i. රජගලතැන්න හන්දියේ විදුලි ට්‍රාන්ස්ෆෝමරය පොළොව මට්ටමෙ සිට අඩි 04ක් පමණ උසින් සවි කර ඇති බැවින් එය මහජනතාවට අනතුරක් සිදු වීම වැළැක්වීමට ආරක්ෂිත වැටක් ඉදි කිරීම<br>(පොලිස් අධිකාරි, අම්පාර)<br>ඊ ලඟ සභාවාරයට පෙර විසඳුමක් ලබා දෙන ලෙස ලංකා විදුලි බල මණ්ඩලයේ විදුලි ඉංජිනේරු දැනුවත් කරන ලදි. | ප්‍රාදේශීය ලේකම්, උහන/ විදුලි ඉංජිනේරු, ලංකා විදුලිබල මණ්ඩලය |
| 9 | මහඔය | i. මුන්දෙණිආරු ව්‍යාපෘතියෙන් කිතුල්ල හා රුගම් ජලාශ යාවෙන ආකාරයට යෝජිත බැම්ම ඉදිකිරීම හේතුවෙන් වැම්පිටි ගම ජලයෙන් යටවීම<br>( සභාපති, මහඔය ප්‍රාදේශීය සභාව)<br>පෙබරවාරි 10 වන දින උදේ 9.30 ට ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමටු සභාපතිතුමිය, ගරු වන ජීවී රාජ්‍ය ඇමතිතුමන්, දිසාපතිතුමන්, ප්‍රාදේශීය ලේකම්, වාරි මාර්ගඅධ්‍යක්ෂ, මුන්දෙණිආරු ව්‍යාපෘති අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සභා සභාපති යන අයගෙන් සමන්විත කමිටුව රැස්ව සාකච්ඡා කර ගැටළුව නිරාකරණය කිරීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්, මහඔය/ වාරිමාර්ග අධ්‍යක්ෂ, අම්පාර. |

**06.** **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රාදේශීය මට්ටමින් විසඳා නොමැති ගැටළු.**

| # | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විෂය | වගකීම් දරණනිලධාරින්/ ආයතනය |
|---|---|---|---|
| 01 | නින්දවූර්/කාරතිවු | i. ගල්ඔය වම්ඇළ සහ දකුණු ඇළ මාර්ග කොන්ක්‍රීට් කර සකස් කිරීම<br>(ගරු. දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසාල් කාසිම් මැතිතුමා)<br>රාජ්‍ය නිලධාරීන් හා දේශපාලන අධිකාරියෙන් සමන්විතව කමිටුවවක් පත් කර මේ පිළිබඳව සාකච්ඡා කිරීමට තීරණය විය. | වාරි මාර්ග ඉංජිනේරු, , සහකාර අධ්‍යක්ෂ, අම්පාර ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය |
| | | ii. අම්පාර දිස්ත්‍රික් වෙරළ ආරක්ෂිත කලාපයේ (Buffer Zone) 65m සීමාව ආසන්නයේ පදිංචිය තහනම් කර ඇතත් දැනට එම කලාපය තුළ පදිංචි කරුවන්ගේ ඉඩම් වෙනුවෙන් විකල්ප ඉඩම් ප්‍රධාන පාරට බටහිර දිශාවෙන් ඇති වගාවට නුසුදුසු ඉඩම්වලින් පස් පුරවා නිවාස ලබා දීමට අනුමැතිය ලබා දීම<br>(ගරු. දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසාල් කාසිම් මැතිතුමා)<br>ගරු සභාපති තුමිය විසින්, කමිටුවක් පත් කර තීරණයකට එළඹෙන ලෙස කාරතිවු/නින්දවූර් ප්‍රාදේශීය ලේකම්ට දැන්විය. | ප්‍රාදේශීය ලේකම්, කාරතිවු/නින්දවූර්, සහකාර ඉඩම් කොමසාරිස්, අම්පාර. කලාප භාර ඉංජිනේරු, වෙරළ සංරක්ෂ දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සහකාකාර කොමසාරිස්. |

| | | | |
|---|---|---|---|
| | | iii.කල්මුණ මාට්ටුවට්ටෙට නිවාස සංකීර්ණය ප්‍රජා අයිතියට පවරා නොමැති වීම<br>පෙරියනිලාවනෙ නිවාස සංකීර්ණයේ වැසිකිළි පද්ධතිය අබලන් වීම<br>**(ගරු. දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු එච්.එම්.එම්. හරීස් මැතිතුමා)**<br>ප්‍රජා අයිතියට පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඒ පිළිබඳ වාර්තාවක් සති දෙකක් තුළ ඉදිරිපත් කරන ලෙස දැන්විය.<br>වැසිකිළි පද්ධතිය ක්‍රමවත් කිරීම පිළිබඳව සුදුසු පියවර ගෙන වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරය දැනුවත් කරන ලදි. | ප්‍රාදේශීය ලේකම්, කල්මුණ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරය. |
| | | **iv.ඔලුවිල් වරාය සංවර්ධනය හේතුවෙන් නින්දවූර්, කාරතිවු ප්‍රදේශවල වෙරළ ඛාදනයට ලක්වීමෙන් වෙරළ කලාපය හානියට පත්ව ඇත. මේ හේතුවෙන් ධීවර කටයුතු කිරීමට ද බාධාවකි. ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කටයුතු කිරීමට පියවර ගැනීම**<br>**(ගරු. දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසාල් කාසිම් මැතිතුමා)**<br>රේඛීය අමාත්‍යාංශය ට මේ පිළිබඳ දන්වා කඩිනමින් ලිපියක් සකස් කරන ලෙස දිසාපතිතුමන්ට දැන්විය | කලාප ඉංජිනේරු, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කල්මුණ |
| | | **v.කාරතිවු අක්කරපත්තු ප්‍රධාන මාර්ගයේ විශාල වශයෙන් සිදුවන රිය අනතුරු වැලැක්වීමට අදාළව වේගය සීමා කිරීමට මාර්ග බාධක දැමීම (Speed breaker)**<br>**(ගරු. දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසාල් කාසිම් මැතිතුමා)**<br>මේ සඳහා තාක්ෂණික වාර්තාවක් සකස් කරන ලෙස පොලිස් අධිකාරී හා මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු දැනුවත් කරන ලදි. | විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය./පොලිස් අධිකාරී, අම්පාර. |
| 02 | මහඔය | **i. මංගලගම - පියංගල මාර්ගයේ මාර්ගයේ විශාල වශයෙන් සිදුවන රිය අනතුරු වැලැක්වීමට අදාළව වේගය සීමා කිරීමට මාර්ග බාධක දැමීම. (වාහන වේගය අධික වීම හා නිරන්තරයෙන් ගවයන් පාරමාරුවීම)**<br>**(ගරු. සභාපති, ප්‍රාදේශීය සභාව, උහන)**<br>මේ සඳහා තාක්ෂණික වාර්තාවක් සකස් කරන ලෙස පොලිස් අධිකාරී හා මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු දැනුවත් කරන ලදි. | විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය./පොලිස් අධිකාරී, අම්පාර |
| | | **i. මාර්ග හා මහා මාර්ග අමාත්‍යාංශයේ ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය යටතේ ගම්පහ කොළණිය - ඉහිණියාගල පාලමේ දෙපස පුරවා සකස් කිරීම**<br>**(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය**<br>පෙබරවාරි දෙවන සතිය තුළ පාලම පස් පිරවීමට ආරම්භ කරන බවත් මාසය අවසානයේ වැඩ නිම කළ හැකිබව විධායක ඉංජිනේරු විසින් දන්වා සිටින ලදි. | විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, අම්පාර |

| | | | |
|---|---|---|---|
| | | තාප්පය අසළ ඇති ජංගම කඩ පාරෙන් අනෙක් පසට ගෙනයාමටත් ඒ පිළිබඳව සොයා බලා සුදුසු පියවරයන් ගන්නා ලෙස අම්පාර ප්‍රාදේශිය ලේකම් දැනුවත් කරන ලදි. | |
| 04 | දෙහිඅත්තකණ්ඩිය | **i. දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී කොට්ඨාශ 46 ක ලෙස බෙදා වෙන් කිරීම<br>(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>දිනයක් යොදාගෙන විශේෂ සාකච්ඡාවක් සිදු කිරීමට තීරණය විය | දිස්ත්‍රික් ලේකම්, අම්පාර |
| | | **ii. නිවාස සංවර්ධන අධිකාරිය මගින් දෙහිඅත්තකණ්ඩිය ප්‍රා.ලේ. කාර්යාලය ඉදිකිරීමට අදාළ ව ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම<br>( ප්‍රාදේශිය ලේකම්, දෙහිඅත්තකණ්ඩිය)**<br>නිවාස සංවර්ධන අධිකාරියේ හිටපු කළමණාකරු විසින් අමාත්‍ය මණ්ඩල තීරණයකින් තොරව ඉඩමේ අයිතිය දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශිය ලේකම් වෙත ලබා දී ඇති අතර එය මහල් නිවාස සංකිර්ණයක් සඳහා වෙන් කර ඇති බව සඳහන් කරන ලදි. මෙම ඉඩම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයීය නව ගොඩනැගිල්ල ඉදිකිරීමට අනුමත කරන බවත් ඒ සඳහා අමත්‍යාංශ මට්ටමේ කටයුතු සිදු කරන ලෙස නිවාස සංවර්ධන අධිකාරියේ කළමනාකරු වෙත දන්වා සිටින ලදි. | කළමනාකරු, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 05 | උහන | **i. උහන සමනබැද්ද නිවාස 50 සඳහා ඉඩම් ඔප්පු කඩිනමින් ලබා දීම<br>(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි,දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>නිවාස සංවර්ධන අධිකාරියේ නව කළමණාකාර තුමන් විසින් තමන් මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන බව දන්වා සිටි අතර පෙබරවාරි 05 වන දින උදේ 10.00ට සමනබැද්ද ප්‍රදේශයේ කෙනෙකු යොමු කරවන බව ගරු සභාපති තුමිය කලමනාකාරු වෙත දන්වා සිටින ලදි. | ප්‍රාදේශිය ලේකම් -උහන/ කළමනාකරු නිවාස සංවර්ධන අධිකාරිය. |
| | | **ii. 2019.08.10 වන දින හිමිදුරාව ගම්මානයට ඇති වූ සුළිසුළං හේතුවෙන් හානි වූ නිවාස සඳහා ආධාර ලබාදීම<br>(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>කොටසක් මේ වන විට ලැබී ඇති බවත්, තවත් රු.මලියන 24 ක් අවශ්‍ය බවත් එය ඉතා කඩිනමින් ලබා ගැනීමට පියවර ගන්නා බවත්, උහන ප්‍රාදේශිය ලේකම් තුමිය විසින් පෙන්වා දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම් - උහන සහකාර අධ්‍යක්ෂ, ආපදාකළමනාකරණ ඒකකය,කච්චේරිය, අම්පාර |
| | | **ii.ශ්‍රී ලංකා යුද හමුදා විශ්‍රාමික සුබ සාධක සංගමයට අනුබද්ධ උහන ශාඛාව සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ඉඩම් කොටසක් වෙන් කර ගැනීම<br>(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>මේ සඳහා උහන තිස්සපුර ප්‍රදේශයෙන් ඉඩම් කොටසක් ලබා දිය හැකි බව උහන ප්‍රාදේශිය ලේකම් තුමිය විසින් ප්‍රකාශ කරන ලදි. | ප්‍රාදේශිය ලේකම් - උහන /නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, අම්පාර. |

| | | | |
|---|---|---|---|
| 03 | අම්පාර | **ii. කරංගාව ග්‍රාම නිලධාරී කොට්ඨාශය පළාත් පාලන ආයතන මට්ටමින් ග්‍රාම නිලධාරී කොට්ඨාශ බෙදා වෙන් කිරීම**<br>**(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>කරංගාව ග්‍රාම නිලධාරී වසම අම්පාර නගර සභාවට හා නාමල්ඔය ප්‍රාදේශීය සභාවට අයත් වීම හේතුවෙන් මතුවන ගැටළුවට හා අනෙකුත් භෞතික පිහිටීමට අනුව නාමල්ඔය ප්‍රාදේශීය සභාවට හා අම්පාර නගර සභාවට අයත් වන ආකාරයට ස්ථාපිත කිරීමට අදාළ ව වාර්තාවක් සකස් කරන ලෙස දිස්ත්‍රික් ලේකම් හා අම්පාර ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරන ලදි. | දිස්ත්‍රික් ලේකම්/ අම්පාර ප්‍රාදේශීය ලේකම්/ පළාත් පාලන සහකාර කොමසාරිස්, අම්පාර. |
| | | **iii. අම්පාර යොවුන් සේනාංකයට ලබා දී ඇති ඉඩම් නිරවුල් කිරීම**<br>**(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>ගරු සභාපතිතුමිය,ප්‍රාදේශීය ලේකම්,නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් , කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, යන අයගෙන් සමන්විත අනුකමිටුවක් පත් කර ස්ථානීය පරීක්ෂාවක් සිදුකිරීමට එකඟතාවය පළ විය | ප්‍රාදේශීය ලේකම් - අම්පාර /නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, අම්පාර |
| | | **iv. අම්පාර නගරයේ ලබා දෙන ඉඩම් සඳහා මායිම් ගල් යොදා පැහැදිලිව යොදාගත හැකි පරිදි ඉඩම් කට්ටි කිරීම හා කාණු පද්ධතිය සෑදීමේ දී එම මාර්ගය අප වෙත නිවැරදිව පෙන්වා දීම**<br>**(සභාපති, නගර සභාව, අම්පාර)**<br>ඉදිරි සභාවාරයට ඉදිරිපත් කිරීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - අම්පාර / නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, අම්පාර/ කළමනාකරු, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය. |
| | | **v. අම්පාර නගරයේ ව්‍යාප්ත වන ඩෙංගු රෝගය මර්ධනය කටයුතු සඳහා රාජ්‍ය ආයතනයන්හි ඒ සඳහා යෙදවිය හැකි ට්‍රැක්ටර් , ට්‍රිපර් රථ ලබාදීම.**<br>**(සභාපති, නගර සභාව, අම්පාර)**<br>ගැටළුව බොහෝ දුරට නිරාකරණය වී ඇති බව සභාව දැනුවත් කරන ලදි. | දිසාපති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර, |
| | | **vi. නවගම්පුර ග්‍රාමයේ රජයේ ඉඩම් අදාළ පවුල් වෙත බෙදා දීම**<br>**(නාගරික මන්ත්‍රී ශ්‍රියාණි පුෂ්පලතා මිය)**<br>අනවසර ඉඩම් අල්ලා ගැනීම මේ වන විට පොලිසියේ මැදිහත් වීමෙන් පාලනයට කර ඇති බවත්,ඉදිරියේ දී ඉඩම් කච්චේරි පවත්වා සුදුසු අයවළුන් වෙත ඉඩම් ලබා දීටම කටයුතු කරන බව අම්පාර ප්‍රාදේශීය ලේකම් - අම්පාර විසින් සඳහන් කරන ලදි | ප්‍රාදේශීය ලේකම් - අම්පාර |
| | | **vii. මේ දිනවල පවතින ඩෙංගු වසංගත තත්ත්වය නිසා රෝගීන්ගේ ක්ෂණික වැඩිවීම පාලනය කිරීම සඳහා රාජ්‍ය ආයතනවල ඇති වගකීම**<br>**(ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අම්පාර)**<br>ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මේ පිළිබඳ ව මුලින් සභාව දැනුවත් කරන ලදි. | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>අම්පාර |
| | | **ii. සෞඛ්‍ය සේවයේ ඇති රහස්‍යභාවය පළුදුවීම නිසා ඇති විය හැකි ලිංගාශ්‍රිත රෝග හා ක්ෂය රෝගීන් වැඩිවීමට ඇති අවධානම**<br>**(ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අම්පාර)** | ප්‍රාදේශීය ලේකම්, අම්පාර |

| | | | |
|---|---|---|---|
| 06 | දමන | **i. අම්/දමන මහා විද්‍යාලයේ ප්‍රාථමික අංශය විශේෂ අවධානය යොමු කර සංවර්ධනය කිරීම (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>මේ වන විට අවශ්‍ය පියවර ගෙන ඇති බව අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පෙන්වා දෙන ලදි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, අම්පාර |
| 07 | අඩ්ඩාලච්චේන | **i. අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් දීඝවාපිය ගම්මානය සඳහා ලබා දෙනු ලබන සමෘද්ධි සහනාධාරය දීඝවාපිය ගම්මානයේ දී බෙදී දීමට කටයුතු කිරීම (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය**<br>මේ පිළිබඳව සමෘද්ධි අමාත්‍යාංශය වෙත දැනුම් දී අනුමැතිය ලබා ගත හැකි බව සමෘද්ධි අධ්‍යක්ෂ විසින් දන්වා සිටින ලදි. සභාවේ අනුමැතියද මේ සඳහා ලබා දුන අතර පොලිස් ආරක්ෂාව සහිතව සහානාධාර බෙදා දීමේකටයුතු සිදුකළ හැකි බව ද මෙහි දී අවධාරණය විය. | **අධ්‍යක්ෂ සමෘද්ධි, දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය, කච්චේරිය, අම්පාර** |
| | | **ii. 2019 වර්ෂයේ නගර සැලසුම් අමාත්‍යාංශය මගින් මාර්ග සංවර්ධනය වෙනුවෙන් වෙන් කරන ලද රු. මිලියන 30 ක ප්‍රතිපාදන 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අවසර ලබා ගැනීම ( සභාපති, ප්‍රාදේශීය සභාව අඩ්ඩාලච්චේන)**<br>අනුමත විය. | පළාත් පාලන සහකාර කොමසාරිස්, අම්පාර./ විධායක ඉංජිනේරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, කල්මුණ |
| | | **iii. ඔලුවිල් ග්‍රාමයේ ගංවතුරින් හානියට පත් බෝක්කු 03 වෙනුවට පාලම් 03 ක් ඉදිකිරිම ( සභාපති, ප්‍රාදේශීය සභාව අඩ්ඩාලච්චේන)**<br>ප්‍රතිපාදන ලැබෙන තෙක් සැලසුම් සකස් කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු වෙත ගරු සභාපතිතුමිය විසින් උපදෙස් දෙන ලදි. | විධායක ඉංජිනේරු. මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග ඉංජිනේරු. අක්කරපත්තු/ පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, අම්පාර. |
| | | **iv. 2019 වර්ෂයේ නගර සැලසුම් අමාත්‍යාංශය මගින් වීථි ලාම්පු සවිකිරීම සඳහා වෙන් කරන ලද රු. මිලියන 20 ක ප්‍රතිපාදන 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අවසර ලබා ගැනීම ( සභාපති, ප්‍රාදේශීය සභාව අඩ්ඩාලච්චේන)**<br>අනුමත විය | විධායක ඉංජිනේරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, කල්මුණ |
| 08 | සම්මන්තුර | **i. වලතාපිටිය 02 මල්ලිගෙහිවු ගම්මානයේ අලිවැට ප්‍රතිසංස්කරණය කිරීම (ප්‍රාදේශීය ලේකම්, සම්මන්තුර)**<br>කි.මී. 01 ක ප්‍රමාණයක් බැවින් ගරු රාජ්‍ය ඇමති තුමන්ගේ අනුමැතියෙන් ක්‍රියාත්මක කිරීමට දිසාපතිතුමන් වෙත පවරන ලදි. | සහකාර අධ්‍යක්ෂ, වනජීවී දෙපාර්තමේන්තුව. |
| | | **ii. අලි මිනිස් ගැටුම්/ වල්අලින් ගෙන් මහකන්නයේ වගාව ආරක්ෂා කිරීම (සභාපති, ප්‍රාදේශීය සභාව සම්මන්තුර)**<br>ගරු රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමන් සමග/ මේ සඳහා දිනයක් යොදාගෙන සාකච්ඡා කිරීමට තිරණය විය. | අණදෙන නිලධාරී, සිවිල් ආරක්ෂක බලකාය උහන/සහකාර අධ්‍යක්ෂ,වනජීවී දෙපාර්ත |
| 09. | එරගම | i.දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයිති ඉඩම් බලහත්කාරයෙන් අයිති කරගැනීම හා ආරම්භ කර ඇති නිවාස ව්‍යාපෘතියට අදාළ පියවර ගැනීම | ප්‍රාදේශීය ලේකම්, දමන./එරගම |

| | | | |
|---|---|---|---|
| | | **( ප්‍රාදේශීය ලේකම්, එරගම.)**<br>මේ පිළිබඳ අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දෙපල හා දිසාපතිතුමන් එක්ව සාකච්ඡා කර තීරණයකට එළඹෙන ලෙස ගරු සභාපතිතුමිය විසින් දන්වා සිටින ලදි. | |
| **10.** | පොතුවිල් | **i.පොතුවිල් පිහිටි සත්ව ඝාතකාගාරය වෙනත් ස්ථානයක් වෙත රැගෙන යාම සඳහා රජයේ ඉඩමක් ලබාගැනීම.**<br>**(සභාපති, පොතුවිල් ප්‍රාදේශීය සභාව)**<br>දිස්ත්‍රික් ලේකම්, පොතුවිල් ප්‍රාදේශීය ලේකම්, පොතුවිල් ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති,සහකාර අධ්‍යක්ෂ ඉඩම් පරිහරණ සැලසුම් හා දිසා වන නිලධාරි වන සංරක්ෂණ යන නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් කර සුදුසු ඉඩමක් වෙන් කිරීමට කටයුතු කරන ලෙස දැනුවත් කරන ලදි. | ප්‍රාදේශීය ලේකම්, පොතුවිල්/සභාපති ප්‍රාදේශීය සභාව/ දිසා වන නිලධාරි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/සහකාර අධ්‍යක්ෂ ඉඩම් පරිහරණ සැලසුම්, අම්පාර. |
| | | **ii. පොතුවිල් ප්‍රදේශයේ මහජන ක්‍රීඩාංගණය සඳහා ඉඩමක් ලබා ගැනීම.**<br>**(සභාපති, පොතුවිල් ප්‍රාදේශීය සභාව)**<br>පොතුවිල් සෙංගමුව ප්‍රදේශයෙන් ඉඩමක් වෙන්කිරීමට අනුමත විය. | ප්‍රාදේශීය ලේකම්, පොතුවිල්/ දිසා වන නිලධාරී, අම්පාර. සහකාර අධ්‍යක්ෂ,ඉඩම් පරිහරණ සැලසුම් - අම්පාර |
| **11.** | කාරතිවු | **i. ගොවිජනසේවා මධ්‍යස්ථානය ඉදිරිපිට ඒ /4 මාර්ගය හරස්කර බෝක්කුවක් හෝ කුඩා පාලමක් ඉදිකිරීම**<br>**( ප්‍රාදේශීය ලේකම්, කාරතිවු.)**<br>මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයක් බැවින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දෙන ලදි, | විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |
| **12.** | මහඔය | **i. අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයට අයත් මහඔය වැම්පිටිය ග්‍රාම නිලධාරී බල ප්‍රදේශය හරහා ගලා යන මහඔය වඩිච්චල මංකඩට මඩකලපුව වෙංකල්අඩි ප්‍රාදේශීය ලේකම් තුමන් විසින් වැලි කැනීම් බලපත්‍ර ලබා දීම හා ඒ අවට ඉඩම් බලහත්කාරයෙන් දමිළ ජනතාව වගා කිරීම එබැවින්, අම්පාර, මඩකලපුව පරිපාලන සීමාව ලකුණු කර, ප්‍රදේශ වෙන්කර, ප්‍රදේශයේ ජනතාවට එම අවස්ථාව ලබා දීම.**<br>(සභාපති,මහඔය ප්‍රාදේශීය සභාව)<br>භෞතික මායිමක් නොමැති බව මහඔය ප්‍රාදේශීය ලේකම් පෙන්වා දෙන ලදි. අම්පාර දිස්ත්‍රික් ලේකම්/මඩකලපු දිස්ත්‍රික් ලේකම්/මහඔය ප්‍රාදේශීය ලේකම්/ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති /අධ්‍යක්ෂ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය / මිනින්දෝරු දෙපාර්තමේන්තුව,වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අම්පාර/ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඩකලපුව එක් ව කමිටුවක් පත් කර සති 03 ක් ඇතුළත් වාර්තාවක් ලබා දීමට කටයුතු කරන මෙන් දන්වා සිටින ලදි.<br>වැලි, කැනීම් බලපත්‍ර තාවකාලිකව නතර කරන මෙන් දන්වා මඩකලපු දිස්ත්‍රික් ලේකම් වෙත දැනුවත් කරන බව දිසාපතිතුමන් විසින් දන්වා සිටින ලදි. | අම්පාර දිස්ත්‍රික් ලේකම්/මඩකලපු දිස්ත්‍රික් ලේකම්/මහඔය ප්‍රාදේශීය ලේකම්/ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති /සහකාර අධ්‍යක්ෂ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය / මිනින්දෝරු දෙපාර්තමේන්තුව,වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අම්පාර/ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඩකලපුව |
| **13.** | පදියතලාව | **i. පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වකුගඩු රෝගීන් සඳහා රු. 5000.00 දීමනාවක් ලබා දීම**<br>**(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය සභාපති ප්‍රාදේශීය සභාව)** | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය අම්පර |

| | | | |
|---|---|---|---|
| | | මෙ පිළිබඳ දිසාපතිවරුන්ගේ සමුළුවට ඉදිරිපත් කළ අතර එහිදී හඳුනාගත් හා නොගත් වශයෙන් වෙන් කර ඇති බැවින් ඒ සඳහා රු.500.00 හා 5000.00 වශයෙන් ගෙවන බව දිස්ත්‍රික්ලේකම් තුමන් විසින් පෙන්වා දෙන ලදි. මෙ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයට හා ජනාධිපති ලේකම් වෙත යොමු කර වාර්තාවක් ඊ ළඟ සභාවාරයට ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දෙන ලදි. | |
| **14.** | අක්කකරපත්තුව | **i.** **අක්කරපත්තුව පොලිස් ස්ථානයට ඉඩමක් වෙන්කර ගැනීම**<br>**(නියොජ්‍ය පොලිස්පති අම්පාර)**<br>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීරණය පිළිබඳව කොළඹට වාර්තා කරන බව දන්වා සිටින ලද අතර දැනට පොලිස් ස්ථානය පවතින ස්ථානයේම අදාළ කටයුතු සිදු කරගෙන යන දැන්විය. එසේම අක්කරපත්තු නගරාධිපති විසින් විකල්ප ඉඩමක් ලබාදීමට කටයුතු කළ හැකි බව සහ ඊට ප්‍රතිපාදන අවශ්‍ය බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. | නගරාධිපති, මහ නගර සභාව අක්කරපත්තු / ප්‍රාදේශීය ලේකම්, අක්කරපත්තු |
| | | **i. 2019 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 අවරණය වන පරිදි ඉදිකිරීම් කටයුතු කරන ලද කොන්ත්‍රාත් කරුවන් සඳහා ගෙවීමට ඇති රු. කෝටි 51 ක මුදල කඩිනමින් ගෙවීමට කටයුතු කිරීම**<br>**( ගරු. පා.ම. දයා ගමගේ මැතිතුමා)**<br>අතැති බිල්පත් සඳහා ප්‍රතිපාදන මේ වන විටත් දිස්ත්‍රික් ලේකම් විසින් අදාළ අමාත්‍යාංශ වලින් ඉල්ලීම් කර ඇති බව දිස්ත්‍රික් ලේකම් ප්‍රකාශ කරන ලදි. | දිසාපති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |
| | | **ii.** **රොන්මඩ බැහැර කිරීමට සුදුසු ඉඩම් වෙන් කර ගැනිම - අම්පාර කොණ්ඩුවටුවාන හා හිමිදුරාව ජල පිරිපහදු මධ්‍යස්ථාන සඳහා**<br>**(සහකාර සාමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය),**<br>දිසාපතිතුමන්, ප්‍රාදේශීය ලේකම්, අම්පාර සහකාර සාමාන්‍යාධිකාරී (ජල සම්පාදන), නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිසර අධිකාරිය) දිසා වන නිලධාරී (වන සංරක්ෂණ) යන අයගෙන් සමන්විත කමිටුව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර සුදුසු ස්ථානයක් පිළියෙළ කර ගන්නා ලෙස දැනුවත් කරන ලදි. | දිසාපති, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර. |
| **15.** | වෙනත් | **iii. පස්කැපීමට අදාළව බලපත්‍ර නිකුත් කිරීමේ දී ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට නොහැකි ව පවතී. එබැවින් කඩිනමින් බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදු කිරීමට පියවරගැනීම**<br>**(අයිරෝඩ්ව්‍යාපෘති අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන අධිකාරිය,මඩකලපුව.)**<br>අදාළ අවශ්‍යතාවයන් වෙන වෙනම ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරුවන් වෙත දැනුම් දුන් අතර, එම එක් අවශ්‍යතාවයක් සඳහා ප්‍රාදේශිය ලේකම්,සහකාර අධ්‍යක්ෂ (මධ්‍යම පරිසර අධිකාරිය) සහකාර අධ්‍යක්ෂ (භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය)යන නිලධාරීන් තිදෙනා එක්ව එක් දිනයක් යොදාගෙන අදාළ ක්ෂේත්‍රය පරීක්ෂා කොට එකවර අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලෙස එම නිලධාරීන්ට උපදෙස් දෙන ලදි.<br>මහඔය අරංතලාව මාර්ගය කි.මී.20 ක් සංවර්ධනය කිරීම ට පියවර ගන්නා ලෙස අයි රෝඩ් අධ්‍යක්ෂ වෙත ගරු සභාපතිතුමිය විසින් දන්වා සිටින ලද අතර ගරු අක්කරපත්තු නගරාධිපතිතුමන් විසින් යෝජනා කරන ලද මාර්ගයක් ඉවත් කර ඇති බවත් එම මාර්ගය නැවත සංවර්ධනය කිරීමට ගරු සභාපති තුමිය අනුමත කරන ලදි. | අදාළ ප්‍රාදේශියවරුන්/ සහකාර අධ්‍යක්ෂ භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය |

| | | | |
|---|---|---|---|
| | | ලාහුගල ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීම පරිදි හුලංනූගේ බක්මීටියාව මාර්ගය ඉදිකිරීමට අනුමත කරන ලද අතර අයි රෝඩ් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කරන ලදි. | |
| | | iv. ගමට ගෙයක් රටට හෙටක් නව වැඩසටහන පිළිබඳ නැවත සලකා බැලීමක් කරන ලෙසට ඉල්ලීමක් කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට ගරු සභාපතිතුමිය විසින් උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්, අම්පාර. |
| | | v. අම්පාර මහ රෝහල අසල සිට වැඩිහිටි නිවාසය දක්වා කුඹුක් ගස් සිටුවා ඇති අතර එසේ තාප්ප අයින් වල කුඹුක් ගස් සිටුවිය හැකිද<br>**(සිරස මාධ්‍ය වාර්තාකරු අචල උපේන්ද්‍ර)**<br><br>එසේ තාප්ප අයින්වල සිටවූවන ලද කුඹුක් ගස් ඉවත් කර ඇති බව මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු සභාවට දැනුම් දෙන ලදි. | විධායක ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය |
| | | vi. වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශීය කළමණාකරු විසින් මේ දිනවල මිල දී ගැනීම් සිදු කරන අතර තෙත වී රු 44.00 කටත් හොඳ වී රු. 50.00 කටත් මිල දී ගන්නා බව සභාව දැනුවත් කරන ලදි. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික්කයේ සියළුම ගොවීන් දැනුවත් කරන ලෙසත් දිසාපතිතුමන්ට දැනුම් දුන් අතර එක් ගොවියෙකුගෙන් වී කි.ග්‍රෑ. 5000 උපරිමයකට යටත්ව මිල දී ගැනීම ට අනුමැතිය දෙන ලදි. | ප්‍රාදේශීය කළමණාකරු, වී අලෙවි මණ්ඩලය අම්පාර. |
| | | vii. කල්මුණ පෙරියනීලාවනෙ කසල කලමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ ගැටළුව මඩකලපු දිසාපතිතුමන් සමග සාකච්ඡා කර විසඳුමක්ලබා ගැනීමට තීරණය විය | දිස්ත්‍රික් ලේකම්, අම්පාර |
| | | viii. 2020.02.04 වන දිනට යෙදෙන 72 වන නිදහස් දිනට නිමිත්තෙන් Green Concept සංකල්පය ට අනුව සිදු කිරීමට අදාළව දියත් කරන රුක් රෝපණ වැඩසටහනට සියළුව රාජ්‍ය ආයතනවල දායකත්වය දැක්විය යුතු අතර රෝපණය කරනලද පැල සංඛ්‍යාව දිස්ත්‍රික් ලේකම් වෙත දැනුම් දෙන ලෙසටද දිස්ත්‍රක් ලේකම් විසින් දැනුවත් කරන ලදි. | දිස්ත්‍රික් ලේකම්, අම්පාර |

## PHYSICAL PROGRESS (UP TO 25TH JAN.2020)

| | AM 01 (82.67) | | AM 02 (97.59) | | AM 03 (80.93) | | AM 04 (75.46) | | AM 05 (71.97) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Complete | In Progress | Complete | In Progress | Complete | In Progress | Complete | In Progress | Complete | In Progress |
| IRM (%) | 100 | | 100 | | 67.5 | | 100 | | 100 | |
| Clearing & Grubbing (km) | 6.67 | 0.2 | 3.47 | 2.02 | 10.83 | - | 0.36 | - | 1.18 | 1.9 |
| Roadway Excavation (km) | 2.72 | 0.35 | 0.5 | 0.2 | - | - | 0.36 | - | - | - |
| Embankment Filling (km) | 2.3 | 0.5 | 0.3 | 0.2 | - | - | 0.24 | 0.1 | - | - |
| Subbase (km) | 2.2 | 0.6 | 0.5 | 0.2 | - | - | 0.24 | 0.1 | - | - |
| ABC (km) | 1.24 | 0.09 | 3.6 | 0.1 | - | - | 0.1 | 0.1 | - | - |
| Prime (km) | 0.78 | - | - | - | - | - | - | - | - | - |
| Asphalt (km) | - | - | - | - | - | - | - | - | - | - |
| Culvert (Nos) | 4 | 14 | 1 | 1 | - | 4 | - | - | - | 3 |
| Lined Drain (m) | 369 | 24 | - | 61 | - | - | 396 | 24 | - | - |

## FINANCIAL PROGRESS (UP TO 25TH JAN. 2020)

| Contract Package | Amount of 1st Advanced Payment | IPC No-2 | IPC No-3 | IPC No-4 | FINANCIAL PROGRESS (% of Value of Works) |
|---|---|---|---|---|---|
| AM 01 | 168,573,494.76 | 75,139,758.23 | 32,889,073.56 | 26,182,421.95 | 13.84 |
| AM 02 | 185,641,825.20 | 45,016,509.03 | 27,369,162.35 | - | 10.70 |
| AM 03 | 221,816,943.20 | 44,286,178.50 | 43,131,720.78 | - | 10.82 |
| AM 04 | 231,552,345.94 | 76,280,927.80 | 54,681,943.69 | 23,782,226.51 | 12.99 |
| AM 05 | 248,471,651.28 | 50,555,094.60 | - | - | 9.30 |

## 08. ස්තුති කථාව

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ කටයුතු සාර්ථක කර ගැනීම වෙනුවෙන් කමිටුවට සහභාගී වී සිටි ගරු සභාපතිතුමියටත්, ගරු ඇමතිතුමන්ටත්, ගරු මන්ත්‍රීවරුන් සහ සියළුම රජයේ නිලධාරීන්ටත්, පොලිස් නිලධාරීන් ,රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්ටත් ,මාධ්‍යවේදීන්ටත්, අම්පාර දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා විසින් තම ස්තුතිය පළකර සිටීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ප.ව. 3.15 ට පමණ අවසන් විය

ඩී.එම්.එල්.බණ්ඩාරනායක,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර

ඩී.එම්.එල්. බණ්ඩාරනායක
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර